පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.
කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශය

වෙළුම 5, අංක 3 | 2000 නොවැම්බර්- දෙසැම්බර්

# රඹුටන් වගාවේ පිටිපුස් රෝගය

2000 වසරේ පැවතුන දේශගුණ තත්ව හේතුවෙන් පුෂ්ප හා ඵල හට ගැනීම විවිධ කාල වල සිදුවීම නිසා රඹුටන් වාරය වෙනදාට වඩා බොහෝ සෙයින් දීර්ඝ විය. කෙසේ නමුත් මේ තත්වය රඹුටන් මල් හා ගෙඩි වලට පිටිපුස් රෝගය පැතිරීම සඳහා බොහෝ ඉවහල් විය. මෙම රෝගය 2000 වසරේදී රඹුටන් ගස් කිහිපයකට බොහෝ සෙයින් සීමා වුවද 2001 වසර වන විට සියළුම රඹුටන් වගාවන් ආසාදනය කර ඇත.

## රෝග ලක්ෂණ

සුදු පැහැති දිලීර ජාලය හා දිලීර බීජානු අතු, ලපටි පත්‍ර, පුෂ්ප හා ඵල වල දක්නට ලැබේ. පළමුව පැල්ලම් ලෙස හටගන්නා මෙම පුල්ලි පසුව අතු, පත්‍ර, පුෂ්ප හා ගෙඩි සම්පූර්ණයෙන්ම ආසාදනය කරයි. අවසානයේ ආසාදිත කොටස් සම්පූර්ණයෙන් අවපැහැ වී, මැලවී, වියලී යන බැවින් විශාල අස්වනු හානියක් සිදුවේ. ලපටි පුෂ්ප හා ගෙඩි වලට ආසාදනය වූ කල හානිය 100% ක් වේ.

## රෝගය පැතිරීම

දිලීර බීජානු වේගයෙන් පැතිරීමට සුළං ආධාර වේ. වියළි, තද සුළං පැතිරීමට වඩාත් උදවු වේ. ඝනකම් පත්‍ර වියන හේතුවෙන් අතු අතර අධික ආර්ද්‍රතාවයක් හට ගැනීම, අධික උෂ්ණත්වය හා ලපටි පටක කොටස් අධික වීම ආසාදනය ඉක්මනින් පැතිරීමට තවදුරටත් හේතු වේ.

## පාලන ක්‍රියා

- අස්වනු නෙලීමෙන් පසුව අනවශ්‍ය හා අමතර අතුරිකිලි ඉවත් කිරීමෙන් පත්‍ර වියන තුළට හොඳින් හිරුඑළිය වැටීමට හා වාතාශ්‍රය සංසරණයට ඉඩ සැලැස්වීම.
- දිරිමත් වර්ධනයක් ඇතිකිරීම සඳහා සමතුලිත පොහොර භාවිතය
- සියළුම රෝගී කොටස් ඉවත්කර විනාශ කිරීම. වැටුණු ඵල හා පත්‍ර එකතු කර විනාශ කිරීම හා ශාකය අවට පරිසරය පිරිසිදුව තබා ගැනීම.
- හිරුඑළිය වැටීමට බාදා කරන අවට පිහිටි වෙනත් ශාක ඉවත් කිරීම.
- රෝග ලක්ෂණ දුටු වහාම රසායනික පාලන ක්‍රියා අනුගමනය කිරීම.

  ජලයේ දියකල හැකි ගෙන්දගම් (සල්ෆර්) ග්‍රෑම් 5 ක් ජලය ලීටර් 10 ක වන ලෙසට දින 7-10 කාලාන්තර වලින් ඉසීම කළ යුතුය.

ක්ලෝරොතැලොනිල්, බිට්ටර්නෝල්, තයොපොනේට් මීතයිල් වැනි දිලීර නාශක ද ප්‍රතිඵලදායි වේ.

කෙසේ නමුත් වඩා ලාබදායී සහ යොදන්නාට හා පාරිභෝගිකයාට අඩුවෙන්ම විෂ සහිත දිලීර නාශකය ගෙන්දගම් (සල්ෆර්) වේ.

*මූලාශ්‍රය: ආචාර්ය පිනාදරී ද සොයිසා මිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ), උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නොරුව.*

# එළවළු, විටමින් A ප්‍රභවයක් ලෙසට

කැරොටින් යනු කහ පැහැති වර්ණකයක් වන අතර එය සමහර එළවළු වල අඩංගු වේ.

අක්මාව තුළදී මෙම කැරොටින් විටමින් A බවට පරිවර්ථනය කරයි. මේ නිසා කැරොටින් වර්ණකය විටමින් වල පූර්ව විටමිනයක් හෙවත් ප්‍රෝ විටමින් ලෙස හඳුන්වයි.

කැරට් සහ කහ පැහැති මදය සහිත බතල වල අඩංගු කැරොටින් ප්‍රමාණය ඉහළය. අධික කැරොටින් සහිත තක්කාලි ප්‍රභේදයන් ද දැන් දක්නට ලැබේ. කැරොටින් වලින් පොහොසත් එවැනි තක්කාලි ප්‍රභේද වල ගෙඩි ඉදෙන විට කහ පැහැති වේ. තායිවානයේ ආසියානු එළවළු පර්යේෂණ හා සංවර්ධන ආයතනය එවැනි ප්‍රභේද නිපදවා ඇත. ගන්නොරුව, උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ පර්යේෂණ නිලධාරිණී ආර්. පීරිස් මහත්මිය ද ඉදිරියේ දී නිර්දේශ කිරීමේ අරමුණු ඇතිව එවැනි කැරොටින් අධික තක්කාලි ප්‍රභේද පිළිබඳ පරීක්ෂණ ආරම්භ කර ඇත.

මඳ අඳුරු ආලෝකයේදී පෙනීම ලබාදීම සඳහා විටමින් A ඉතා වැදගත් සංඝටකයක් වේ. විටමින් A ඌනතාවය නිසා රාත්‍රී අන්ධතාව ඇතිවේ. එළවළු පමණක් ආහාරයට ගන්නා අය විශේෂයෙන්ම රාත්‍රී අන්ධතාවය වැනි රෝගී තත්ව වලින් මගහැරීමට නම් කැරොටින් අධික කැරට්, බතල (කහ), කැරොටින් වැඩි තක්කාලි වැනි එළවළු වගී ආහාරයට එක් කරගත යුතුවේ.

*මූලාශ්‍රය : ඒ. පාලමකුඹුර (පර්යේෂණ නිලධාරී) උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නොරුව.*

# මිදිවැල් කප්පාදුව

මිදි ගෙඩි හටගන්නේ අලුතින් හටගත් අතු රිකිලි වල පමණි. මේ නිසා නව අතු රිකිලි වර්ධනය උත්තේජනය සඳහා මිදි වැල් කප්පාදු කිරීම වසරකට දෙවතාවක් එනම් ජනවාරි මුල් කාලය තුළ හා ජුනි මැද කාලය තුළ සිදුකළ හැකිය.

මිදි වැල් කප්පාදුවෙන් පසු මාස 3 ක් වියලි කාලය පවතින සේ කප්පාදු කරන කාලය තෝරා ගත යුතුය. මේ නිසා වියලි කලාපයේ යල කන්නය තුළ ජුනි 15 ට පෙර වැල් කප්පාදු කළ යුතු වේ. එවැනි වැල් වලින් අස්වැන්න මහ කන්නයේ වර්ෂාව ආරම්භ වීමට පෙර ලබාගත හැකි වේ. ජනවාරි මුල කාලය තුළ කප්පාදු කළවිට යල වැස්ස ආරම්භ වීමට පෙර අස්වනු ලබාගත හැකිවේ.

වැල් කප්පාදු කිරීමට සතියකට පෙර ජල සම්පාදනය නතර කලයුතු අතර, කප්පාදුවෙන් දින 4 කට පසු නැවත ජලය ලබාදිය යුතුවේ.

මිදි වැල් සඳහා පොහොර මිශ්‍රණය පහත පරිදි සකසාගත යුතුය.

| | |
|---|---|
| යූරියා | ග්‍රෑම් 125 |
| ත්‍රිත්ව සුපර් පොස්පේට් | ග්‍රෑම් 250 |
| සල්ෆේට් ඔෆ් පොටෑෂ් | ග්‍රෑම් 125 |
| මුලු එකතුව | ග්‍රෑම් 500 |

ඉහත මිශ්‍රණ අනුපාතය අනුව පිළියෙල කරගත් මිශ්‍රණයෙන් කිලෝ ග්‍රෑම් 2 ක්, වසර 3 ක් වයසැති වැලක් සඳහා කප්පාදු කිරීමට පෙර හෝ පසු යෙදිය යුතුය. එයට අමතරව කාබනික ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් පොහොර යොදන අවස්ථාවේදී යෙදිය යුතුය.

කප්පාදු කිරීම ආරම්භ කිරීම සඳහා හොඳින් මේරූ, දුඹුරු පැහැති, අවම තරමින් පැන්සල් ගනකම සහිත අතු රිකිලි තිබීම ඉතා වැදගත් වේ. එවැනි අතු විශාල ප්‍රමාණයක් තිබේනම් වගාවෙන් වැඩි අස්වැන්නක් බලාපොරොත්තු විය හැකි වේ. එම අතු රිකිලි පර්ව 5-6 ක් ඉතිරි වනසේ කපා ඉවත්කරනු ලැබේ. මෙම අවස්ථාව වනවිට අංකුර ශුප්ත අවස්ථාවේ තිබිය යුතුයි (පර්ව වල අංකුර ක්‍රියාකාරී වර්ධන අවධියක නොතිබිය යුතුය).

මෙම වසරේ කප්පාදුව සඳහා මේරූ අතු නොමැතිනම් පසුගිය වසරේ අතු රිකිලි පර්ව 3-4 ක් සිටින සේ කප්පාදු කරනු ලැබේ. අතු රිකිලි ඉතා සිහින් සහ දුර්වල වර්ධනයෙන් යුක්ත නම් පර්ව 2-3 ක් ඉතිරි වන සේ කප්පාදු කිරීමෙන් ප්‍රමාණවත් වර්ධක වර්ධනයක් ලබාගත හැකිවේ.

කප්පාදු කිරීම ඉතා මුවහත් පිහියක් හෝ සෙකටියරයක් මගින් පිරිසිදු තනි කැපුමක් සිටින සේ කළයුතුය. 5 වන හෝ 6 වන ගැටය කෙළවර සිට සෙ.මී. 2-3 ඈතින් සිටින සේ වැල කපා දැමිය යුතුය. කප්පාදුවේදී සියළුම කොළ පැහැති අතු හා පත්‍ර සියල්ලද ඉවත්කළ යුතුය. ප්‍රභේද සහ වැල් පුහුණු කරන ආකාරය අනුව කප්පාදු ක්‍රම වෙනස් වේ. ඉහත සඳහන් කල කප්පාදු ආකාරය ප්‍රභේද රාශියක් සඳහා සුදුසු වේ.

කප්පාදුවෙන් අනතුරුව තඹ අඩංගු දිලීර නාශකයක් ඉසීම අවශ්‍ය වේ. කෙසේ නමුත් වියලි කලාපයේ උණුසුම් දේශගුණයක් සහිත ජුනි මාසයේ කප්පාදු කළේ නම් මෙය සාමාන්‍යයෙන් අවශ්‍ය නොවේ. නමුත් ජනවාරි කප්පාදුවෙන් අනතුරුව වර්ෂාකාලය තුළ තඹ අඩංගු දිලීර නාශකයක් හෝ බෝඩෝ මිශ්‍රණය යෙදීම අත්‍යාවශ්‍ය වේ.

කප්පාදුවෙන් දින 4 කට පසු ජලය ලබාදීම හා ඉන්පසු දිගටම තෙතමනය පවත්වාගැනීම කළයුතු වේ. මෙය නැවත වර්ධනය සඳහා ඉතා වැදගත් වේ. කප්පාදුවෙන් සති 3-4 කදී පුෂ්පීකරණය ආරම්භ වන අතර මාස 3 කදී පමණ ඉදුනු ගෙඩි නෙලා ගතහැකි වේ.

*මූලාශ්‍රය : ආර්.එම්. ආරියරත්න මහතා*
*අධ්‍යක්ෂ (ව්‍යාප්ති හා පුහුණු),*
*ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, පේරාදෙණිය.*

# රෝස මල් අපනයනයේ දී නැවුම් බව පවත්වා ගැනීමට

ප්‍රවාහන කාලසීමාවේදී නැවුම් බව නැතිවී මල් වල ගුණාත්මය අඩුවීම මල් අපනයන කරුවන්ට පවත්නා බලවත් ගැටළුවකි. කැපූ රෝස මල් නිෂ්පාදන මධ්‍යස්ථානයක් වන ජපානයේ ෂිමිසු-ෂි-ෂිමිසු ආයතනය මේ සඳහා විශේෂිත ක්‍රමයක් හඳුනාගෙන ඇත.

කාඩ්බෝඩ් පෙට්ටිවල මල් තිරස් අතට අසුරා අපනයනය සාමාන්‍ය ක්‍රමයයි. මවු ශාකයෙන් මල වෙන් කල අවස්ථාවේ සිටම නැවුම් බව අඩුවීම ආරම්භ වන බැවින් එම ආකාරයෙන්ම පවත්වා ගැනීමේ ගැටළුව විසඳා ගතයුතු වේ.

මෙම නව ක්‍රමයේදී ජලය වෑස්සීම සිදුනොවන කඩදාසි බඳුනේ පතුලට තෙත් පල්පයක් දමා කැපූ රෝස මල් වල නටුව එම තෙත් පල්පයට ඇතුල්කර මල් සිරස් අතට ඇසිරීම සිදුකරයි. නටුවේ කැපුම් මතුපිටින් මල් ජලය අවශෝෂණය සිදුකරයි. මෙම කඩදාසි බඳුන් පෙට්ටි වල අසුරා අපනයනය කරනු ලැබේ. පල්පය මගින් තෙතමනය රඳා පවත්වා ගන්නා බැවින් ප්‍රවාහනයේදී පෙට්ටි ඇල වුවද ජලය පිටතට වෑස්සීමක් සිදුනොවේ.

මෙය භාවිතයට පහසු ක්‍රමයක් බැවින් මෙම ක්‍රමය ජපානයේ ක්‍රමයෙන් ජනප්‍රිය වෙමින් පවතී. භාවිතා කල පල්පය අවසානයේ පිළිස්සීම හෝ වෙනත් කටයුතු සඳහා නැවත භාවිතා කළ හැකි වේ. වසන්තයේ මුල් කාලයේ උෂ්ණත්වය ඉහළ යන බැවින් එවැනි අවස්ථාවල දී නොනවත්වා ජලය අවශෝෂණය කර ගැනීම නිසා රෝස මල්ද දිගටම වර්ධනය වීම මෙම ක්‍රමය භාවිතයේ දී මතුවන එක් ගැටළුවකි.

*මූලාශ්‍රය : Farming Japan, Vol. 35-2, 2000*

# "ගන්නොරුව සුදු" සීනි අඩු බතල ප්‍රභේදයක්

වැලෙහි මුල කොටසට ආසන්නයෙන් හටගන්නා මධ්‍යම ප්‍රමාණ දිගු, වැල් රැසක් සහිත අර්ධ-වැල් ආකාරයේ වර්ධන විලාශයක් මෙම ප්‍රභේදය පෙන්නුම් කරයි. ඇන්තොසයනින් වර්ණකය නිසා මදක් රත් පැහැවූ මෘදු අග්‍රස්ථයන් හැරුණු විට මෙම ප්‍රභේදයේ මුළු වැලම කොළ පැහැයක් ගනී. ශාක පත්‍රයන්හි හැඩය වෙනස්වන නමුදු වැඩි වශයෙන් ඇත්තේ මධ්‍යස්ථව බෙදුනු පත්‍ර වේ. වැඩි පඳුරු දැමීමේ හැකියාවක් ඇති මෙම බතල ප්‍රභේදය සීඝ්‍රයෙන් වර්ධනය වන්නකි.

බොහෝ දුරට ඒකාකාරී හැඩයෙන් යුතු අල රවුම් සිට ඉලිප්සාකාර හැඩයෙක් ගන්නා අතර, විවෘත පොකුරු ආකාරයට වර්ධනය වේ. සුදු පැහැති අලවල බාහිර පෘෂ්ඨය සුමට වන අතර මාංශලය ලාකහ පැහැයක් ගනී. ආර්ථික අස්වැන්නක් ලබාදීම සඳහා මෙම ප්‍රභේදයට මාස 3 1/2 - 4 ක් පමණ වර්ධක කාලයක් අවශ්‍ය වේ.

මෙම වර්ගයේ විශේෂිත ලක්ෂණයක් වන්නේ අස්වනු නෙලා ගත් අල වල ඇති ඉතා අඩු පැණිරස භාවයයි. මාංශල යුෂයේ බ්‍රික්ස් අගය 6-7% පමණ වන අතර මෙය දැනට නිර්දේශ කර ඇති අනිකුත් ප්‍රභේදයන්ගේ එම අගයනට වඩා 30% ක් පමණ අඩුවේ. 27-28% තරම් වූ මධ්‍යස්ථ වියලි ද්‍රව්‍ය ප්‍රමාණයක් අලවල ඇති බැවින් තැම්බූ විට මෘදු තෙත් සහ මාංශලමය ගතියක් පෙන්වයි.

දිවයිනේ නොයෙකුත් ප්‍රදේශයන්හි පවත්වන ලද පර්යේෂණ වලදී ගන්නොරුව සුදු ප්‍රභේදය නිරන්තරයෙන්ම වැඩි අස්වැන්නක් පෙන්නුම් කර ඇත (වගුව 1). කෘෂි දේශගුණික කලාප බොහොමයකදී මෙම ප්‍රභේදය නිර්දේශිත අනෙකුත් ප්‍රභේදවලට වඩා 28-115% වැනි අස්වනු වාසියක් පෙන්වා ඇත.

**වගුව 1: ගන්නොරුව සුදු සහ අනෙකුත් නිර්දේශිත බතල ප්‍රභේදවල අස්වනු සැසඳීමේ සාරාංශය**

| ප්‍රභේදය | අස්වැන්න | | | |
|---|---|---|---|---|
| | 1995[a] | 1995-1996[b] | 1997[c] | මාධ්‍ය |
| ගන්නොරුව සුදු | 20.2 | 19.8 | 20.8 | 20.2 |
| වාරියපොල රතු | 12.4 | 9.8 | 10.2 | 10.8 |
| CARI-426 | 17.1 | 16.2 | 17.6 | 17.7 |
| LSD (0.05) | 1.9 | 2.1 | 2.0 | (0.05) |
| CV% | 15.5 | 16.2 | 14.8 | |

a = ස්ථාන 6 ක මාධ්‍ය අගය
b = ස්ථාන 8 ක මාධ්‍ය අගය
c = කන්න 2 කදී ස්ථාන 6 ක මාධ්‍ය අගය

සහභාගිත්ව තෝරා ගැනීමේ ක්‍රියාදාමය තුලින් තෝරා ගන්නා ලද ප්‍රථම බතල ප්‍රභේදය ගන්නොරුව සුදු වේ. මෙම ප්‍රභේදය තේරීමේ කාර්යාවලියේදී වගාකරුවන්, වෙළෙන්දන්, පාරිභෝගිකයන් හා ආහාර සැකසුම් කර්මාන්ත කරුවන් වැනි බෝගය භාවිතා කරන්නන් විසින් ඔවුන්ගේ උපයෝගිතාවයට අනුකූල බවට ප්‍රභේදයේ ගුණාත්මක අගයයන් පිළිබඳව විනිශ්චය සපයනු ලැබීය. මෙම ප්‍රභේදයේ අඩු සීනි ප්‍රමාණයක් ඇති බැවින් ආහාර කර්මාන්ත සඳහා (Pastry industry) අර්තාපල් වෙනුවට ආදේශකයක් ලෙස භාවිතා කළ හැක.

උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ අල බෝග අංශය මගින් තේරීම සිදුකල මෙම ප්‍රභේදය 1999 දෙසැම්බර් මාසයේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් වගාකිරීම සඳහා නිර්දේශ කරන ලදී.

*මූලාශ්‍රය : කේ.පී.යූ. ද සිල්වා මයා, (පර්යේෂණ නිලධාරී,) උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, ගන්නොරුව.*

# තිබ්බටු

සොලනේසී කුලයට අයත් උද්භිද විද්‍යාත්මකව සොලනම් ටෝවුම් *(Solabum tovum)* ලෙස තිබ්බටු හඳුන්වයි. ක්‍රමාකරණ උද්භිද විද්‍යා මූලාශ්‍ර වලට අනුව එය ගෝනබටු (Gonabatu) ලෙසද හඳුන්වයි.

බහුවාර්ෂික ශාකයක් වන තිබ්බටු හෙවත් ගෝනබටු හිතකර තත්ව යටතේ සෙ.මී. 200 ක් දක්වා පමණ උසට වැඩේ. වියලි කලාපයේ හොඳින් වැවේ. කටු සහිත වීම සහ සුදු පැහැති මල්, තිබ්බටු ශාකයට විශේෂිත ලක්ෂණ වේ.

තිත්ත තිබ්බටු ලෙස තවත් ශාකයක් ආයුර්වේද ඖෂධ ලෙස භාවිතා වේ. මෙම ශාකයේ සිහින් දිගු අතු, ශාකය උසට වර්ධනය වනවිට පහලට එල්ලා වැටේ. එහි කටු විශාල වශයෙන් පවතින අතර දම් පැහැති මල් හටගනී. මෙම ශාකය උද්භිද විද්‍යාත්මකව සොලනම් ට්‍රයිලබේටුම් *(Solanum trilabatum)* ලෙස හඳුන්වයි.

ඖෂධීය ගුණාංග හා පළිබෝධ නාශක භාවිතය අඩුවීම වැනි හේතු නිසා තිබ්බටු ක්‍රමයෙන් ජනප්‍රිය වෙමින් පවතින එළවළු බෝගයකි. කෙසේ නමුත් විශාල පරිමාන වගාවන් පළිබෝධ නාශක භාවිතය අවශ්‍ය කරවයි.

*මූලාශ්‍රය : ඒ. පාලමකුඹුර, පර්යේෂණ නිලධාරී,*
*උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය,*
*ගන්නොරුව.*

# කැප්පෙටිපොල නිල් - නව වැල්බෝංචි ප්‍රභේදයක්

බෝංචි ශ්‍රී ලංකාවේ ඉතා ජනප්‍රිය එළවළුවකි. වැල් හා පඳුරු බෝංචි අතුරින් වැල් බෝංචි බදුල්ල දිස්ත්‍රික්කයේ වගාකරුවන් අතර ජනප්‍රිය වගාවකි.

කෙන්ටකි වොන්ඩර් ග්‍රීන් සහ කෙන්ටකි වොන්ඩර් වයිට් යන ප්‍රභේද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිර්දේශිත වැල් බෝංචි ප්‍රභේද වේ. මෙයට අමතරව විවිධ වර්ග රාශියක් ගොවීන් වගාකරනු ලබයි.

මෙම ප්‍රභේද ක්ෂේත්‍රයේදී මිශ්‍රවීම නිසා ඒකාකාරී වගා ප්‍රභේද දක්නට නොලැබීම වර්තමාන ගැටළුවකි. එමෙන්ම නිර්දේශිත ප්‍රභේද මලකඩ රෝගය හා ඇන්ත්‍රැක්නෝස් රෝගයට පාත්‍රී වේ. මේනිසා නව වැඩි දියුණු කල ප්‍රභේදයක අවශ්‍යතාව පැන නැගුනි.

1999 දෙසැම්බර් මාසයේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් "කැප්පෙටිපොල නිල්" නමින් නව ප්‍රභේදයක් නිර්දේශ කරන ලදී. පර්යේෂණ පැවැත්වීමේ දී මෙයට RGB - 2 යන අංකය භාවිතා විය.

වැල් බෝංචි ප්‍රභේදයක් වන කැප්පෙටිපොල නිල් ශාකයේ පත්‍රිකා වල මධ්‍ය පත්‍රය ත්‍රිකෝණාකාරයට හුරු ඕවලාකාර ස්වරූපයක් (triangular ovate) ගනී. පත්‍ර නටුවේ මුල තද කොළපාටය. පුෂ්ප ලා දම් පැහැති වේ. දින 45 කදී 50% ක් මල් පිපෙන අවස්ථාවට පත්වන අතර සෙ.මී. 18-20 ක් දිග, සුළු ලෙස වක්‍ර වූ කොළ පැහැති කරල් හටගනී.

කරලේ කෙඳි ගතිය තරමක් ඇති අතර කෙලවර නැමී ඇත. එක පොකුරක කරල් 2-4 ක් පමණ හටගනී. බීජ නිසා මධ්‍යස්ථ ලෙස බෙදුනු කරලේ බීජ 7-8 ක් දැකගත හැකිය.

පළමු අස්වැන්න සිටුවීමෙන් දින 60-65 කට පසුව ලබාගත හැකි අතර අස්වනු වාර 6-8 ක් ලබාගත හැකිවේ. සාමාන්‍යයක් වශයෙන් එක වැලකින් කරල් 46 ක් පමණ ලබාගත හැකි අතර, හෙක්ටයාරයකට ටොන් 17 ක් පමණ ලබාගත හැකිය. බීජ කිලෝග්‍රෑම් 1 ක් සඳහා කරල් කිලෝ ග්‍රෑම් 18 ක් අවශ්‍ය වේ.

*මූලාශ්‍රය : ආචාර්ය එල්.ජී හේරත්,*
*නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ*
*උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය,*
*ගන්නෝරුව.*

**නිවැරදි කිරීමක්**

කෘෂි තාක්ෂණ වෙළුම 4 අංක 6 පත්‍රිකාවේ උසස් ගුණාත්මයෙන් යුතු නව වී ප්‍රභේදය බීජී 360 වාර්තාවේ වී බුසලකින් ලබාගත හැකි සහල් අස්වැන්න කි.ග්‍රෑ. 21.5 ලෙස සටහන් වී ඇති නමුත් එය වී බුසලක බර කි.ග්‍රෑ. 21.5 ක් ලෙස නිවැරදි විය යුතුය.

කෘෂි තාක්ෂණ වෙළුම 5 අංක 1 හි බීජී 359 - මාස 3 1/2 වයස් කාණ්ඩයේ නව වී ප්‍රභේදයක් යන වාර්තාවේ 5 වන ඡේදයේ දෙවන වාක්‍ය පහත ලෙස නිවැරදි විය යුතුය. වී බුසලක බර කි.ග්‍රෑ. 22 ක් වන අතර එනම් එම වයස් කාණ්ඩයට අයත් අනෙකුත් ප්‍රභේද වලට වඩා වැඩි වී ප්‍රමාණයක් ලබා ගත හැක.

**කෘෂි - තාක්ෂණ ....... ලුහුඬින්**

කාලීන තාක්ෂණික තොරතුරු සංක්ෂිප්තව තාක්ෂණවේදීන්, විශේෂයෙන්ම ව්‍යාප්ති නිලධාරීන් වෙත ලබාදීමේ අරමුණ උදෙසා කෘෂි - තාක්ෂණ පත්‍රිකාව ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය විසින් වරින් වර නිකුත් කරනු ලැබේ. මෙම පත්‍රිකාවේ අඩංගු තොරතුරු බොහොමයක්ම ප්‍රභවය වී ඇත්තේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විවිධ ආයතන සහ මධ්‍යස්ථාන වලිනි. තවද, වෙනත් ඕනෑම මූලාශ්‍රයකින් උපුටා ගත හැකිවුද, ක්ෂේත්‍රයේ ප්‍රායෝගිකව යොදාගත හැකිවුද, තොරතුරු වේ නම්, එවැනි දෑ ද කෘෂි - තාක්ෂණ පත්‍රිකාවෙහි අන්තර්ගත වනු ඇත.

*- සංස්කාරක -*

*සංස්කරණය*
**පී. වාසුදේවා**

*පරිවර්තනය*
**ජයන්තා ඉලන්කෝන්**

වැඩිදුර තොරතුරු සඳහා විමසන්න : අධ්‍යක්ෂ, ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, තැ.පෙ. 18, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.

කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය මගින් ප්‍රකාශයට පත් කෙරිනි.

**රා.සේ.පි.**

**මුද්‍රිත ද්‍රව්‍යය**

**භාර නොදුනහොත් ආපසු යොමු කරන්න:**

**අධ්‍යක්ෂ,**
**ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය,**
**තැ.පෙ. 18,**
**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,**
**පේරාදෙණිය.**

මෙම පත්‍රිකාව, පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ පරිගණක අංශයේ පිටු සකස් කර ගන්නෝරුව කෘෂිකර්ම මුද්‍රණාලයේ දී මුද්‍රණය කරන ලදී.